5014

0 8 NOV 2017 ජලමාර්ග කළමනාකරණ අංශය

# මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු වාර්තාව හා පෙර කන්න රැස්වීම් වාර්තාව

## 2017 ඔක්තෝබර් මාසය

## කබ්බෑව මහා වාරිමාර්ග ව්‍යාපාරය

පැවැත්වූ දිනය - **2017.10.12**

වේලාව - පෙ.ව.9.30

ස්ථානය - නේවාසික ව්‍යාපෘති කලමනාකරණ කාර්යාලය , කරුවලගස්වැව

**සහභාගී වූ රාජ්‍ය නිළධාරීන්**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එල්.පුබුදු නිහාල් ශාන්ත | නේ.ව්‍යා.කළමනාකරු |
| 02 | එච්.වයි.එස්.ද සොයිසා | වනජීවි නියාමක |
| 03 | එස්.එම්.එන්.සුභසිංහ | සංවර්ධන නිළධාරී |
| 04 | ඒ.නලීෆ් | ඉං.සහකාර |
| 05 | එම්.එම්.එම්.වසීම් | ඉං.සහකාර |
| 06 | එච්.එම්.මෙත්තා සුරංගනී | ගො.සං.ප්‍රා.නි |
| 07 | එස්.ඒ.එස්.ජේ.පුෂ්පකුමාර | පොල්.සං.නිලධාරී |
| 08 | එම්.පී.ඩී.අනෝමා ආරියපාල | කෘ.ප.නි.ස |
| 09 | කේ.එන්.එස්.කුමුදුනී | කෘ.ප.නි.ස |

**සහභාගී වූ ගොවි සංවිධාන නියෝජිතයින්**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | කේ.ඒ.සිරිවර්ධන | සභාපති,වම් ඉවුර |
| 02 | එම්.පී.එම්.ජයතිලක | භාණ්ඩාගාරික,වම් ඉවුර |
| 03 | ඩබ්.එස්.ඩී.කුමාර පෙරේරා | ලේකම්,වම් ඉවුර |
| 04 | එච්.එම්.අනුර කුමාර | උපදේශක,වම් ඉවුර |
| 05 | කේ.හරිස්චන්ද්‍ර | සභාපති,තේවනුවර |
| 06 | උදික කුමාර | භාණ්ඩාගාරික |
| 07 | කේ.එස්.නිශාන්ත | භාණ්ඩාගාරික,ප්‍රදීපාගම |
| 08 | ඩබ්.දයාරත්න | සභාපති |
| 09 | රුබන් දිසානායක | භාණ්ඩාගාරික,පළදාගම |
| 10 | පී.අනුර සාලිත | ලේකම් ,මයිලන්කුලම |
| 11 | ජේ.ඒ.පියතිලක | උප සභාපති |
| 12 | ඒ.එස්.ජයතිලක | උප සභාපති |
| 13 | එල්.ඩී.සිරිල් ආනන්දවර්ධන | ඇළ නියෝජිත |
| 14 | එස්.පී.විමලදාස | ඇළ නියෝජිත |
| 15 | ඩබ්.එම්.සිරිසේන | සාමාජික |
| 16 | ඩබ්.ජයසේන | සාමාජික |

## 2017/18 මහ කන්නය සඳහා දින වකවානු හා වගා කොන්දේසි යෝජනා කිරීමේ

## පෙර වගා රැස්වීම

## තබ්බෝව මහා වාරි මාර්ග ව්‍යාපාරය

## 2017.10.12

අරමුණ :- ප්‍රධාන ජලාශයේ ජලය නොමැතිමුත් ඉදිරි කාලසීමාවේදී වැසි අපේක්ෂාවෙන් ඒ කාලවකවානු වලට හා කලාප වලට යෝග්‍ය ලෙස හැකි අවස්ථාවේ බාධාවකින් තොරව වගා කටයුතු ආරම්භ කිරිමට හා පවත්වා ගෙන යාමට අවැසි ලෙස යෝජනා සකස්කර ගැනීමට මෙම පෙර වගා රැස්වීම පවත්වන බැවින් ඒ සඳහා ගොවි නියෝජිතයින්ගේ හා රාජ්‍ය අංශවල අදහස් ලබා ගනිමින් 2017/18 මහ කන්නය සඳහා සුදුසු වගා යෝජනා සකස් කර වගා කන්න රැස්වීමට ඉදිරිපත් කිරිම.

2017/18 මහ කන්නයේ ප්‍රමුඛතාවය

| කලාපය | ගොවි සංවිධාන | අක්කර ප්‍රමාණය |
|---|---|---|
| 01. | වම් ඉවුර,පළුදාගම | 593 |
| 02. | පැරකුම්,සේවනුවර | 878 |
| 03. | මයිලන්කුලම,ප්‍රදීපාගම | 682 |

නිර්දේශ ඉදිරිපත් කිරිම:- වාරිමාර්ග දෙපාර්තමේන්තුව- ඉංජිනේරු සහකාර වසීම් මහතා

- 2017.10.12 ට ජලාශයේ ජල මට්ටම- නැත
- ඉදිරියේදි පහත ජල ප්‍රමාණය ප්‍රධාන ජලාශයට ලැබෙන්නේ නම් වගාව කලාප ක්‍රමයට ආරම්භ කළ හැකි බව
- 2017/18 මහ කන්නයේ ප්‍රථම කලාපය ආරම්භ කිරිමට අඩි 12 ක් ප්‍රධාන ජලාශයට ජලය ලැබිය යුතු බව
- දෙවන කලාපය ආරම්භ කිරිමට අඩි 14 ක් ලැබීම
- තෙවන කලාපය වගා කටයුතු ආරම්භ කිරිමට අඩි 16 ක් ජලය ලැබීම අවශ්‍ය බව

ගොවිජන සේවා- ගොවිජන සංවර්ධන නිලධාරි- මෙත්තා සුරංගනී මෙනෙවිය

- අවශ්‍ය බීජ 50% ක් සහනාධාර ක්‍රමය යටතේ සැපයීමට බලාපොරොත්තු වන බව
- නව පොහොර සහනාධාර චක්‍රලේඛනය යටතේ තබ්බෝව දකුණ ඉවුර ගොවීන්ට මෙවර පොහොර සහනාධාර මුදල් හිමි නොවන බව.(පසුගිය කන්න 02 වගාව විනාශ වීම.වගා නොකර පොහොර සහනාධාර මුදල් ලබාදී ඇති බැවින්)
- අනිකුත් සියලුම සේවා සැපයිය හැකි බව

ගොවි සංවිධාන

- ජලාශයට ප්‍රමාණවත් ජලය ලැබීමෙන් පසු පමණක් වගාවට යොමු වීම.
- සමස්ත ව්‍යාපාරයටම ප්‍රමාණවත් ජලය නොලැබී අඩි 12 කට වඩා අඩු ජලයක් ලැබෙන්නේ නම් කලාප ක්‍රමයේ ප්‍රමුඛතාවයට අනුව වගා කටයුතු සිදු කිරිම.

මෙම නිර්දේශ හා යෝජනා වලට අනුව පහත සඳහන් යෝජනා සකස් කර ගන්නා ලදී.

1. ජලාශයට අඩි 12 ක් ජලය ලැබෙන්නේ නම් ප්‍රමුඛ කලාපය වන මයිලන්කුලම හා ප්‍රදීපගම වගාවට යොමු විම.මූලික බිම් සැකසීම අඩි 11½ වන අවස්ථාවේ ආරම්භ කිරිමට යෝජනා කර ගැනීම.
2. පළමු කලාපය වගාවට යොමුවී සති 02 ක් ඇතුලත ජලාශයට අඩි14 ක ජල ප්‍රමාණයක් ලැබෙන්නේ නම් දෙවන කලාපය වන තේවනුවර, පැරකුම ගොවි සංවිධාන වගාවට යොමුවීම.
3. දෙවන කලාපය වගාවට යොමුවී මාසයක් ඇතුලත ජලාශයට අඩි 16 ඉක්මවා ජලය ලැබෙන්නේ නම් හා රදෙව බැදි ඇළ මගින් ජලාශයට ජලය ලැබෙන්නේ නම් තුන්වන කලාපය එනම් වම් ඉවුර හා පළදාගම ගොවි සංවිධාන වගාවට යොමුවීම.
4. ජලාශයට අඩි 11 ක ජල ප්‍රමාණයක් පමණක් ලැබීම තුළ කිසිදු කලාපයක් වගාවට යොමු නොවී සෙසු අවශ්‍යතා සඳහා ජලය රඳවා ගැනීම.
5. 2017/18 වගා කන්න රැස්වීම ජලාශයට අඩි 11½ ක් පමණ ජලය පැමිණි පසු පරිසර තත්වය සැලකීමෙන් දිසාපතිතුමාගෙන් දිනයක් ලබා ගැනීමෙන් පසු  වගා රැස්වීම පැවැත්වීමට යෝජනා කර ගැනීම.
6. ව්‍යාපාරයේ ගොවින් වගාකන්න 3 ක් වගා කටයුතුවල නියැලීමට නොහැකිවීම තුල නියමිත වගා කාල සීමාවන් ඉක්මවා ගියද ජලාශයට ජලය ලැබෙන්නේ නම් අවධානම බාර ගනිමින් වගාව ආරම්භ කිරිම.
7. පොහොර සහනාධාර මුදල් ලබා දෙන මෙන් අදාල අංශවල අවධානය යොමු කිරිම.ඉදිරි වගා කන්නයක් හිලව් කිරීමෙන් හෝ මෙවර කන්නය සඳහා පොහොර සහනාධාර මුදල් ලබාදෙන මෙන් ඉල්ලීම.

## මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු වාර්තාව

## 2017 ඔක්තෝබර් මාසය

## තබ්බෝව මහා වාරිමාර්ග ව්‍යාපාරය

### පසුගිය කමිටු වාර්තාවේ තීරණ පිළිබඳ සමාලෝචනය

- අදාල අංශ වෙත යොමු කිරීමට යෝජනා කරගත් තීරණ සියල්ල දැනුවත් කර ඇති බව -නේවාසික ව්‍යාපාර කළමනාකරු
- ක්ෂේත්‍ර පරික්ෂාවන් සඳහා යෝජනා කරගත් ස්ථාන පරික්ෂා කල බව - ඉංජිනේරු සහකාර

### පසුගිය වාර්තාවේ යෝජනා ස්ථිර කිරීම

- යෝජනා කිරීම- පළදාගම ගරු සභාපති
- ස්ථිර කිරීම - මයිලන්කුලම ගරු භාණ්ඩාගාරික

### ආයතන සංවර්ධන-නේවාසික ව්‍යාපාර කළමනාකරු

| කාරණය | ඉලක්කය | ප්‍රගතිය | විශේෂ සටහන් |
|---|---|---|---|
| මහ සභා පැවැත්වීම | 12 | 09 | වගා කන්නය ප්‍රමාද වන බැවින් ප්‍රමාද වී මහ සභා පැවැත්වීමට තීරණය කර ඇති බව |
| කාරක සභා | 06 | 06 | ගොවීන් දහවල් කාලයේ ක්ෂේත්‍රයේ නොමැති හෙයින් රාත්‍රී කාලයේ (සවස 6.00න් පසු) කාරක සභා පවත්වනු ඇත. |
| ගොවි සංවිධාන ගිණුම් පොත් විගණනය | 06 | 05 | පැරකුම්පුර ගොවි සංවිධානයේ පොත් විගණනය සඳහා නොවැම්බර් මස අවසානයට පෙර සිදුකිරීම. |
| මාසික මුදල් සාරාංශ සකස් කිරීම | 06 | 06 | දැනට මාසිකව සකස් කිරීම කරනු ලබයි. |
| සාමාජික නාම ලේඛන යාවත්කාලීන කිරීම | 06 | 04 | දැනට සිදුකරමින් පවතී. 2017 දෙසැම්බර් මස අවසන් වීමට ප්‍රථම සිදුකිරීම. |
| ඒකාබද්ධ ගොවි සංවිධාන සක්‍රීය කිරීම | 01 | 01 | ජූනි මස පිහිටවූ අකර ලියපදිංචි කටයුතු දෙසැම්බර් මස අවසන්වීමට ප්‍රථම සිදු කිරීම. |
| නිරන්තර නඩත්තු වැඩ හඳුනා ගැනීම | 06 | 06 | 2018 වර්ෂයට අදාලව 2017 වර්ෂයේ දෙසැම්බර් මස 15 ට පෙර |

- යොදාගත් පරිදි දිනයේ පහසු වේලාවක කාරක සභාව පවත්වන ලෙසත්
- ගිණුම් පොත්වල සියලු අඩුපාඩු සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්
- සාමාජික නාම ලේඛන,නඩත්තු ලේඛන පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් දැන්විය.
- පැරකුම්පුර ගොවි සංවිධානයේ විගණනය සඳහා අදාල පොත් පත් ලබාදීමට කටයුතු කරන ලෙස දැන්විය.
- සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන ලෙස නිරන්තර නඩත්තු වැඩ හඳුනාගනිමින් කම සැලසුම් සකස්කරන ලෙස දැන්විය.
- හොඳම ගොවි සංවිධානය තේරීම සඳහා අවශ්‍ය සුදුසුකම් පිළිබඳ දැනුවත් කිරීම.
- රාජ්‍ය නිලධාරීන් සියලු දෙනා සහභාගි වන හෙයින් ගොවි නියෝජිතයන් සියලු දෙනා කමිටුවට සහභාගී කරන මෙන් දැන්විය.

<u>වාරිමාර්ග ඉංජිනේරු සහකාර- එම්.එම්.එම්.වසීම් මහතා</u>

| ඉදිරිපත් කල අය | කාරණය | විසඳුම | වගකීම |
|---|---|---|---|
| මයිලන්කුලම | වාරි නිර්මිත නිසි ආකාරව ක්‍රියාත්මක නොවන හෙයින් මෙවර වතුර ගෙන ඒමට පෙර ප්‍රතිසංස්කරණය කළ යුතු බව | පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු සිදු කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | දොරවල් (Turnout)සඳහා ග්‍රිස් ලබා දෙන ලෙස | ලබා දීමට කටයුතු කරනු ලබයි | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| පළුදාගම | නඩත්තු කටයුතු සඳහා JCB යන්ත්‍රය ලබා දීමට කටයුතු කරන ලෙස | අලුත්වැඩියා කළ පසු යන්ත්‍රය ලබා දීමට කටයුතු කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| වම් ඉවුර | D1 ප්‍රධාන ඇළේ LB8 ඇළේ සාදා ඇති කොන්ක්‍රීට් වේල්ල සඳහා පාලමක් සාදා ගැනීම | අවශ්‍යතාවය සොයා බලා ඉදිරියේදී එය සිදු කිරීමට නිර්දේශකර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරයි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| තේවනුවර | දකුණු ඉවුර ප්‍රධාන ඇළ මාර්ගය සමඟ ඇති කෘෂි මාර්ගය අබලන් තත්වයක පැවතීම | පරික්ෂාකර බලා අවශ්‍ය පියවර ගැනීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| වම් ඉවුර ගරු සභාපති | LB8 ඇළ මතින් පාලමක් දැම්මට කටයුතු කරන ලෙස | පරික්ෂාකර බලා අවශ්‍ය පියවර ගත්තා ලෙස | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| තේවනුවර ගොවි සංවිධානය | ප්‍රධාන ඇළේ සිට කුඹුරුවල ජල හැරවුම් වලට යොදා ඇති දොර ගේට්ටු කැඩීයාම. | පරික්ෂාකර බලා අවශ්‍ය පියවර කන්නය පටන්ගැනීමට පෙර සිදු කිරීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | තම්බපණ්ණි ග්‍රාම නිලධාරි වසමේ පන්සල්ගල ඇළ මාර්ගය හරහා ඇති අලි වැට මීටර් 40-50 ක් ප්‍රමාණයෙන් ආපස්සට ගත යුතු බව | අවශ්‍යතාවය බලා වනජීවි කාර්යාලය සමඟ සාකච්ඡා කර එම කටයුත්ත සිදු කිරීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| පළුදාගම ගොවි සංවිධානය | ප්‍රධාන වැවේ මැද සොරොව්ව අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතු බව | විශේෂ අවශ්‍යතාවයක් ලෙස සලකා සිදු කිරීමට කටයුතු කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | දොර පියන් කැඩීයාම හා අබලන්වීමෙන් ක්‍රමවත්ව ජලය ලබාගැනීම හා කළමනාකරණය සිදු කිරීමට අපහසු වීම | පරික්ෂාකර බලා 2017 මහ කන්නය ආරම්භ වීමට ප්‍රථම සිදු කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | D1 ඇළෙහි නඩත්තු කටයුත්ත දැනට ඇණහිට තිබීම හා එය හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස | සොයාබලා අදාල කොන්ත්‍රාත්කරු හැකි ඉක්මනින් දැනුවත්කර අවශ්‍ය පියවර ගැනීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| පළුදාගම ගොවි සංවිධානය | ප්‍රධාන ඇළ මාර්ගයේ තම බල ප්‍රදේශයේ ඇති ප්‍රථම රෙගුලේටය අසල කොන්ක්‍රිට් නිර්මිත උඩින් ජලය ගලා යෑමෙන් පස් බැමි සේදීමකට ලක්වීම හා ජලය නාස්ති වීම | පස් දමා බැම්ම උස් කොට සකස් කිරීමට JCB මැෂිම ලබා දීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| මයිලන්කුලම | D2 ඇළෙහි OT1 පැති බැම්ම සෑදිය යුතු බව. | සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | *D1*, *D2*, *D3* ඇල බැම්ම කැඩී ඇති බැවින් මාස්කන්නයට පෙර ප්‍රතිසංස්කරණය කිරිම සිදුකල යුතු බව. | JCB යන්ත්‍රය ලබා දී අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට පියවර ගැනීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | කෙත් ඇළවල් සහ ප්‍රධාන ඇළවල් ප්‍රතිසංස්කරණය නොකිරීමෙන් විනාශවී ඇති බව | ප්‍රධාන ඇළේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇති බවත් ලබන වර්ෂයේදී ලැබෙන ප්‍රතිපාදන මත අනෙකුත් කටයුතු සිදු කිරීමට පියවර ගැනීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | විනාශ වී ඇති කුඹුරු බට වෙනුවට අලුත් බට දැමීම. | අවශ්‍ය කටයුතු බලා සිදු කිරීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

## වෙනත්-නේවාසික ව්‍යාපෘති කළමනාකරු

| ඉදිරිපත් කළ අය | කාරණය | විසඳුම | වගකීම |
|---|---|---|---|
| පැරකුම් ගොවි සංවිධානය සම්පත් මහතා | 2017-18 මහ කන්නයේ වී වගාව සඳහා ඉදිරියේදී ලැබෙන වර්ෂාවත් සමඟ ප්‍රමාණවත් ජලය වැවට පැමිණීම මත පෙර කන්න තීරණ ගැනීම නිවැරදි බවත් වගාව සිදු කිරීමට නම් අවමය අඩි 10 මට්ටමවත් ජලාශය පිරිය යුතු බවත් ඊට අඩු ජල මට්ටමකින් වගාව ඇරඹුවහොත් ඉදිරියේදී තබ්බෝව ප්‍රදේශය දැඩි ජල හිඟයකට මුහුණ දීමට සිදු විය හැකි බවත්ය. | සියලුම ගොවි සංවිධාන ඒකමතිකව එම තීරණ නිවැරදි බව ප්‍රකාශ කළ අතර එම තීරණ මහ දිසාපතිතුමා දැනුවත් කර ඉදිරියේදී කන්න රැස්වීම හා තීරණ සාකච්ඡා කර ගන්නා බව. | නේ.ව්‍යා. කළමනාකරු |
| නේ.ව්‍යා කළමනාකරු | ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුරුතවෙල,රිදියගම,හා කිරිදිඔය ව්‍යාපාර වෙත යන බව | ඒ සඳහා මෙමස 25,26,27 දින යෝජනා කර ඇත | නේ.ව්‍යා. කළමනාකරු |
| | රක්ෂිත පුහුණු හා ආපදා පුහුණු වැඩසටහන මෙම මස පැවැත්වීමට කටයුතු යොදා ඇත. | රක්ෂිත පුහුණු වැඩසටහන මෙම මස 17 වන දින ප්‍රදීපාගම සමිති ශාලාවේදී පැවැත්වීමට යෝජනා විය.ආපදා පුහුණුව පැරකුම් ගොවි සංවිධානයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත. | නේ.ව්‍යා. කළමනාකරු |

| | | | |
|---|---|---|---|
| පැරකුම් ගොවි සංවිධානය | හිටපු ඉංජිනේරු මහතා ස්ථාන මාරුවක් ලබා ඇති හෙයින් තබබෝව මහා වාරිමාර්ග ව්‍යාපාරයට කළ සේවය වෙනුවෙන් ස්තුතිය පුද කළ යුතු බවත් ඒ සඳහා උත්සවයක් පැවැත්විය යුතු බවත් | සියලුම ගොවි සංවිධාන ඒ සඳහා එකඟතාවය පල කළ අතර ඒ සඳහා දිනයක් ලබා ගෙන සිදු කිරීමට තිරණය විය. | නේ.වාහ. කළමනාකරු |

<u>ගොවිජන සේවා දෙපාර්තමේන්තුව</u>

<u>ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරි- මෙත්තා සුරංගනී මෙය</u>

| ඉදිරිපත් කල අය | කාරණය | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගො.ප්‍රා.සං. නිළධාරී | එළඹෙන මහ කන්නය සඳහා බිත්තර වී ලබා දීම. | 2017-18 මහ කන්නය සඳහා බිත්තර වී 50% ක දායකත්වය යටතේ ලබා දීමට කටයුතු කරන අතර උපරිමය අක්.5 දක්වා ලබා දේ.මහා වාරි අක්.2114.5 ක්ද සුලු වාරි අක් 1946.25 කුත්මුලු ගණන 4060.75ක් වගා කිරීමට සැලසුම් කර ඇත. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| | පොහොර සහනාධාරය ලබා ගැනීම | පොහොර සහනාධාරය සඳහා 2016 යල - 2017 යල (පසුගිය කන්න 3) වගා නොකල නමුත් පොහොර සහනාධාරය ලබා ගත් ගොවීන් සඳහා මෙවර පොහොර සහනාධාරයට හිමිකම් නැත | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| | ගොඩ ඉඩම් වගාව සඳහා ආධාර ලබාදීම | බඩඉරිඟු,මිරිස්,සෝයා, අර්තාපල්, සඳහා හෙක්ටයාරයකට රු.10000.00 ක් ලබා දීමට කටයුතු සිදු කරයි. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| | පලතුරු ගම්මාන ඇති කිරීම | පලතුරු ගම්මාන වැඩසටහන යටතේ සෑම ග්‍රාම සේවා වසම් තුලම පලතුරු වගා ව්‍යාපෘතියක් සිදු කරනු ලබයි. පළාගම- පැණි දොඩම් මුරුක්කුවටවන-අනෝදා | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය | කාන්තා ගොවි සංවිධාන යටතේ සියලුම ගෙවිලියන්ගේ ගෙවතු වගාවන් සඳහා අවශ්‍ය කොම්පෝස්ට් පොහොර තම ගෙවත්තේම නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරයි. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| සියලුම ගොවි සංවිධාන | මෙවර මහ කන්නය සඳහා පොහොර සහනාධාරය නොදෙන්නේ නම් ගොවීන් දැඩි දුෂ්කරතාවයකට පත්වන අතර රජය මැදිහත් වී පොහොර සහනාධාරය ලබාදීමට කටයුතු නොකොළහොත් සියලුම ගොවීන් වගාවෙන් ඈත්වී විරෝධය පළ කිරීමත් දැනට නිකුත් වී ඇති චක්‍රලේඛ වලට ගොවීන් විරුද්ධත්වය පළ කරන අතර ඉහල නිලධාරින් ඒ පිළිබඳව දැනුවත් කර මේ සඳහා සහනයක් ලබා දීමට කටයුතු කරන ලෙස | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ මේ පිළිබඳව දැනුවත් කිරීම | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |

| ඉදිරිපත් කළ අය | කාරණය | විසඳුම | වගකීම |
|---|---|---|---|
| පොල් සං.නිලධාරි | පොල් පැළ ලබාදීම | දැනට හානි සිදුවී ඇති ප්‍රදේශ අනුව ප්‍රමුඛතා ලැයිස්තුවට අනුව පැළ ලබා දීම සිදු කරනු ලබයි.දැනට තේවනුවර ප්‍රදේශයට පොල් පැළ ලබා දී ඇත. | පොල් සංවර්ධන මණ්ඩලය |
| | දැඩි නියං තත්වය මත වගාවන් විනාශ වීම | මෙවර නියං තත්වය මත වැඩි වශයෙන් විනාශ වී ඇත්තේ කුඹුරු ආශ්‍රිතව වගා කළ පොල් ගස්ය. එයට හේතු වශයෙන් එම වගාවන් වැඩි වශයෙන් ජලය ආශ්‍රිතව තිබීමත් එහි මූල පද්ධතිය බිම මට්ටමෙහි පැවතීමත්ය.එම නිසා නියඟය එම වගාවන් සඳහා දැඩිව බලපෑවේය. | පොල් සංවර්ධන මණ්ඩලය |
| | පොල් වගාව සඳහා බිම් සැකසීම | තබ්බෝව ප්‍රදේශයේ පොල් සඳහා සුදුසු පසක් නොමැති හෙයින් මේ සඳහා අලුතින් පස සකස් කර ගත යුතු අතර පැළ සිටුවීමේදී අඩි 3x3 වලවල් කපා පොල් ලෙලි දමා කාබනික පොහොර සමඟ පැළ සිටුවිය යුතුය. එසේ නොමැති වුවහොත් ලබා දෙන පැළ විනාශ වීමේ ප්‍රවණතාවය වැඩිය.එමෙන්ම තෙතමනය රැඳවීම සඳහා දිග අඩි 7,පළල 4 හා ගැඹුර 3 වලවල් සාදා ඒ සඳහා පොල් ලෙලි දමා සකස් කළ යුතුය.අක්කරයකට වලවල් 20 ක් පමණ.පේළි 4. | පොල් සංවර්ධන මණ්ඩලය |
| පැරකුම් ගොවි සංවිධානය සම්පත් මහතා | පැරකුම් ප්‍රදේශයටත් පොල් පැළ ලබා දිය යුතු බව | පොදු වශයෙන් විනාශ වි ඇති ප්‍රදේශ බලා ඉදිරියේදි ලබා දිමට කටයුතු කරන බව | පොල් සංවර්ධන මණ්ඩලය |

| | | | |
|---|---|---|---|
| නේවනුවර ගොවි සංවිධානය | පොල් පැළ ලබා දීමේදී යම් කිසි ගැටලු තත්වයක් ගොවීන් අතර ඇති වූ හෙයින් නැවත පැළ ලබා දීමේදී ගොවි සංවිධානයේ සහයද ඒ සඳහා ලබා ගන්නා මෙන් ඉල්ලා සිටිමි | වක්‍රලේඛ අනුව අදාළ පොල් පැළ ලබා දී ඇති අතර ඉදිරියේදි ඒ සඳහා ගොවි සංවිධාන සහයෝගය ලබා ගැනීමත් සියලුම ප්‍රදේශ සඳහා අදාල විස්තර ගොවිජන සං.දෙපාර්තමේන්තුව නේ.ව්‍යා.කාර්යාලයේ සහයෝගය ලබාගැනීමට කටයුතු කිරීම | පොල් සංවර්ධන මණ්ඩලය |

**වනජීවී දෙපාර්තමේන්තුව**

**එච්.වයි.එස්. ද සොයිසා -වනජීවී නියාම**

| ඉදිරිපත්කල අය | කාරණය | විසඳුම | වගකීම |
|---|---|---|---|
| මයිලන්කුම ගරු භාණ්ඩාගාරික | ගම්වැදී ඇති අලින් තම ඉඩම්වල බෝග විනාශ කරන නිසා ඇඩීව ජන ජීවිතයට තර්ජනයක් සිදුවීම | දැනට පවතින තත්වය මත අලින් එලවීම සඳහා අලි වෙඩි ලබාදීමට හැකි බවත් එම ගැටළුව පිළිබඳව ඉහළ නිළධාරින් දැනුවත් කිරීමට කටයුතු කිරීම හා දැනට සිටින නිළධාරින්ට අනුව රාජකාරි සිදු කිරීම.<br>විදුලි වැටවල් නැවත ප්‍රතිසංස්කරණ සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | වනජීවී දෙපාර්තමේන්තුව |
| | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම. | පුත්තලම වනජීවි අධ්‍යක්ෂ තුමා ව්‍යාපාර කමිටුව සඳහා කැඳවීම. | වනජීවි දෙපාර්තමේන්තුව |

..................................

එල්.පුබුදු නිහාල් ශාන්ත
නේවාසික ව්‍යාපෘති කලමනාකරු(වැ.බ.)
තබ්බෝව ව්‍යාපාරය

එල්. පුබුදු නිහාල් ශාන්ත
නේවාසික ව්‍යාපෘති කළමණාකරු (වැ.බ)
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය
තබ්බෝව ව්‍යාපාරය
කරුවලගස්වැව

පිටපත්-

01.අධ්‍යක්ෂ ,වාරිමාර්ග කළමනාකරණ අංශය ,කොළඹ
02.දිස්ත්‍රික් ලේකම් ,පුත්තලම
03.අධ්‍යක්ෂ (වත්කම් කළමනාකරණ) ,වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ
04.දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ ,පුත්තලම
05.නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ,පුත්තලම
06.ප්‍රාදේශීය ලේකම්, කරුවලගස්වැව/ වනාතවිල්ලුව
07.ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, හලාවත
08.වනජීවී සංරක්ෂණ සහකාර අධ්‍යක්ෂ, පුත්තලම
09. වාරිමාර්ග ඉංජිනේරු, පුත්තලම
10.ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරී, පුත්.තබ්බෝව/වනාතවිල්ලුව
11.කෘෂිකර්ම උපදේශක, පුත්.තබ්බෝව/වනාතවිල්ලුව
12.පොල් සංවර්ධන නිළධාරී,පුත්.තබ්බෝව/වනාතවිල්ලුව
13.කජු සංවර්ධන නිළධාරී, පුත්.තබ්බෝව/ වනාතවිල්ලුව
14.තබ්බෝව ව්‍යාපාරයේ සියළුම ගොවි සංවිධාන නියෝජිතයින්